පැලියගොඩ නගර සභාව - 2024
----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

පැලියගොඩ නගර සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 (1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට පැලියගොඩ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු

කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1. පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රමිතියේ 2 වන පරිච්ඡේදයේ 2.5 ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත පිළියෙල කළ යුතු වුවත්, පෙර වර්ෂයන් සඳහා සමාලෝචිත වර්ෂය තුල දී ලැබී තිබූ මුද්දර ගාස්තු වටිනාකම රු. 66,219,485 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස සලකා ගිණුම්ගත කර තිබුණි.	මුද්දර උපලේඛන සකස් කරන ආසන්නම වර්ෂවල ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගණනය කරනු ලබන බව.	ප්‍රමිතිය අනුව කටයුතු කළ යුතුය.
(ආ)	ප්‍රමිතියේ 3 වන පරිච්ඡේදයේ 3.29 ඡේදය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ස්ථාවර වත්කම් බැහැර කිරීමෙන් ලද රු. 712,070 ක මුදල ගලපා නොතිබුණි.	ඉදිරි ගිණුම් වර්ෂයේදී මෙවැනි වැරදි සිදු නොවන ලෙස කටයුතු කරන බව.	ප්‍රමිතිය අනුව කටයුතු කළ යුතුය.
(ඇ)	ප්‍රමිතියේ 3 වන පරිච්ඡේදයේ 3.6 ඡේදය අනුව ප්‍රවර්තන මූල්‍ය ප්‍රකාශනවල සමාලෝචිත කාලපරිච්ඡේදයේ ඉදිරිපත් කර ඇති සියළුම වටිනාකම් සඳහා තුලනාත්මක තොරතුරු හෙළිදරව් කළ යුතු වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ තුලනාත්මක තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.	ඉදිරි ගිණුම් වර්ෂය තුල මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුල තුලනාත්මක තොරතුරු ඇතුලත් කිරිමට කටයුතු කරන බව.	ප්‍රමිතිය අනුව කටයුතු කළ යුතුය.
(ඈ)	ප්‍රමිතියේ 3 වන පරිච්ඡේදයේ 3.32 ඡේදය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේ දී ලැබිය යුතු සේවක ණය වෙනස රු.719,603 ගලපා නොතිබුණි.	ඉදිරි ගිණුම් වර්ෂයේදී මෙවැනි වැරදි සිදු නොවන ලෙස කටයුතු කරන බව.	ප්‍රමිතිය අනුව කටයුතු කළ යුතුය.
(ඉ)	ප්‍රමිතියේ 3 වන පරිච්ඡේදයේ 3.7 ඡේදය අනුව අස්තිත්ත්වයක් පිළියෙල කළ අයවැය ලේඛනවල අයවැයගත තොරතුරු එම කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළ යුතු වුවත් වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එපරිදි ඉදිරිපත් කර නොතිබුණි.	වත්කම්,වගකීම්,ස්කන්ධය සහ මුදල් ප්‍රවාහයේ වෙනස්වීම් වන බැවින් එම ප්‍රකාශයන් සමග අයවැය තොරතුරු සංසන්දනාත්මක ලෙස ඉදිරිපත් කළ නොහැකි බව.	ප්‍රමිතිය අනුව කටයුතු කළ යුතුය.

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් කරන ලද මාරු කිරීම් රු.682,215 ක් ආදායමට හඳුනා ගැනීම නිසා සමාලෝචිත අතිරික්තය එක් වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.	මෙවැනි වැරදි සිදු නොවන ලෙස ඉදිරියේදී කටයුතු කරන බව .	ආදායම නිවැරදිව හඳුනාගත යුතුය.

1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් ගිණුම් ශේෂ 09 ක මූල්‍ය ප්‍රකාශය අනුව ශේෂය හා උපලේඛන අනුව ශේෂය අතර, රු.9,117,873 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.	නොසැසදීම් හැකි ඉක්මණින් සොයා උපලේඛන හා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	උපලේඛන යාවත්කාලීනව පවත්වා ගනිමින් ඒ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය.

1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය ප්‍රකාශයන අනුව එකතුව රු. 7,951,510 ක් වූ ගිණුම් අයිතම 05 ක ශේෂ තහවුරු කර ගැනීම සඳහා උපලේඛන , කාල විශ්ලේෂණ හා ජර්නල් වවුචර් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකිවිය.	ඉදිරි ගිණුම් වර්ෂයේදී අවසන් ගිණුම සමග සියළු සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තොරතුරු සනාථ කිරීමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

1.7. නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි මු.රෙ.571	වර්ෂ 02 ඉක්ම වූ රු. 10,096,418 ක තැන්පත් නියාදනය කර නොතිබුණි.	නියාදනය නොවූ වසර 02 ට වැඩි තැන්පත් නිරවුල් කිරීමට කටයුතු කරන බව.	මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

(ආ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2.6.1 (අ) (I) ඡේදය	හැකිතාක් අවම කාල සීමාවක් ඇතුලත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා ප්‍රසම්පාදන කාල සටහන සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටුව වෙත නිර්දේශ කොට එකඟ කර වීමට තාක්ෂණික කමිටුවේ සාමාජිකයින් සාමුහිකවත්/ තනි තනිවත් වගකිව යුතු වුවත්, ඇස්තමේන්තු වටිනාකම රු. මිලියන 52.9 ක් වූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 07 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	ප්‍රසම්පාදන කාල සටහනේ සඳහන් නිශ්චිත දිනයන්හි ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ගැනීමට නොහැකි වන බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම ඉක්ම වූ ආදායම රු. 23,433,605 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ වියදම රු. 38,021,625 ක් විය.

2.2 මූල්‍ය පාලනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ලංකා බැංකුවේ ජංගම ගිණුමට අදාළව 2024 දෙසැම්බර් 31 දිනට මුදල් පොතට අනුව ශේෂය හා බැංකු ගිණුමේ ශේෂය අතර රු.40,250 ක නොසැසඳීමක් විය. 1987 වර්ෂයේ සිට පැවත එන රු. 250 ක සුළු මුදල් සහ රු. 40,000 ක ස්ථාවර තැන්පත් පොලියක් මෙයට ඇතුලත් වන අතර වර්ෂ 37 ක් තිස්සේ නිරවුල් කර නොතිබුණි.	මෙම නොසැසඳීම විසඳා ගැනීමේ හැකියාවක් නොපවතින බව.	සසඳා නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	2024				2023			
ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තු ගත ආදායම්	බිල්කළ ආදායම්	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තු ගත ආදායම්	බිල්කළ ආදායම්	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
	000'	000'	000'	000'	000'	000'	000'	000'
වරිපනම් හා බදු	91,050	77,796	76,677	26,946	51,010	48,332	46,145	21,750
කුලී	7,894	3,333	5,145	458	5,685	2,197	4,415	2,265
බලපත්‍ර ගාස්තු	3,785	2,010	3,702	40	3,700	2,010	4,051	63
වෙනත් ආදායම්	41,825	–	79,517	–	24,746	–	39,466	–
එකතුව	**144,554**	**83,139**	**165,041**	**27,444**	**85,141**	**52,539**	**94,077**	**24,078**

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
වරිපනම් හිඟ ආදායම තුල ප්‍රවර්තන වර්ෂයට අදාල ඒකක 875 කින් රු. 3,701,253 ක්ද වර්ෂ 1 ත් 3 ත් අතර ඒකක 3,584 කින් රු. 12,523,328 ක්ද, වර්ෂ 3 ත් 5 ත් අතර ඒකක 465 කින් රු. 3,083,081 ක්ද, වර්ෂ 5 ත් 10 ත් අතර ඒකක 458 කින් රු. 4,038,476 ක්ද, වර්ෂ 10 ට වඩා වැඩි ඒකක 272 කින් රු. 3,574,820 ක්ද අයවිය යුතුව පවතින බව නිරීක්ෂණය විය.	වරිපනම් හිඟ ආදායම තුළ 2024 වර්ෂයට අදාළ ඒකක 5654 ක් සඳහා රු 26,920,958 ක් අය විය යුතුව පැවති අතර ඉන් 2025 මැයි 20 වන දිනට රු.7,689,065 ක් අයවී ඇති බව.	හිඟ වරිපනම් කඩිනමින් අයකරගත යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 අගෝස්තු 25 දිනැති ඉල්ලීමක් පරිදි ශ්‍රී ජයතිලකාරාම පුරාණ මහා විහාරයේ මිදුල කොටස තාර දමා සංවර්ධනය කිරීම සඳහා රු. 315,000 ක් වූ ඇස්තමේන්තුවක් මත 2024 සැප්තැම්බර් 30 දින මාසයක කාලයකින් නිම කිරීම සඳහා රු. 290,342 ක ගිවිසුම්ගත වටිනාකමට කාන්තා ගොවි සංවිධානයක් වෙත ප්‍රදානය කර තිබුණි. බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව 2024 ඔක්තෝබර් 07 දින අවසන් කර තිබූ මෙම ව්‍යාපෘතිය සඳහා රු.292,282 ක් සභා අරමුදල් යොදවා තිබුණි.	ඉදිරියේදී මෙවැනි ව්‍යාපෘති සම්බන්ධයෙන් නිවැරදි ක්‍රමවේදය අනුගමනය කරමින් ගරු ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබා ගෙන කටයුතු කරන බව.	පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබා ගත යුතුය.
(ආ)	ස්ථාවර වත්කම් සම්බන්ධ ලේඛන යාවත්කාලීනව නඩත්තු කර නොතිබුණි.	ඉදිරියේ දී යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව.	යාවත්කාලීනව නඩත්තු කළ යුතුය.

3.2 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

	විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	පොදු වෙළඳපොල කඩකාමර අංක 27/8 සංවර්ධනය කර බදු ලබාදීම		
(i)	කඩකාමර සඳහා ටෙන්ඩර් කැඳවීමේ දී නගර සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ රීති අංක 314 ප්‍රකාරව ටෙන්ඩර් කමිටුවක් හා ඇගයීම් කමිටුවක් පත්කළ යුතු අතර රීති අංක 327 ප්‍රකාරව කිසිදු සාමාජිකයෙකු ඇගයීම් කමිටුව සහ ටෙන්ඩර් කමිටුව යන දෙනකහිම සාමාජිකයෙකු නොවිය යුතු වුවත් ටෙන්ඩරය විවෘත කිරීම හා ඇගයීම යන දෙකම එකම නිලධාරින් විසින් සිදුකර තිබුණි.	එක ටෙන්ඩරයක් පමණක් ඉදිරිපත් වූ බැවින් ඇගයීම් කමිටුව සඳහා යොමු කිරීමට අවශ්‍ය නොවූ හෙයින් ටෙන්ඩර් විවෘත කිරීම හා ටෙන්ඩර්කරු තෝරා ගැනීම ටෙන්ඩර් කමිටුව විසින්ම සිදු කර ඇති බව.	නගර සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ii)	මෙම ටෙන්ඩර් කැඳවීම අසාර්ථක වීම නිසා සභාව විසින් කඩ කාමරය මස්කඩයක් ලෙස නවීකරණය කිරීම වෙනුවෙන් වැයකරන ලද රු.575,177 ක මුදල සභාවට අනාර්ථික වියදමක් වී තිබුණි.	තක්සේරු දෙපාර්තමේන්තුව කඩ කාමරය මිශ්‍ර භාවිතය සඳහා රු.5,000/-ක මාසික තක්සේරු කුලියක් නියම කර මිශ්‍ර භාවිතය සඳහා වසර 03 ක කාලයකට බදු ලබා දීමට ලේකම්වරිය විසින් තීරණය කර ඇති බවත් ඒ අනුව කටයුතු සිදු කරමින් පවතින බව.	කඩ කාමර නවීකරණය කිරීමේ දී හා ටෙන්ඩර් කැඳවීමේ දී විධිමත් සැලැස්මකට අනුව කළ යුතුය.
(ආ)	සභාව විසින් 2024 වර්ෂය සඳහා රථවාහන ගාල් කිරීමේ ස්ථාන 5ක් හා බියගම පාර 4 කණුව පොදු වැසිකිලිය කිසිදු ශක්‍යතා අධ්‍යනයකින් තොරව ටෙන්ඩර් කිරීම සඳහා රු.204,884 ක වියදමක් දරමින් පුවත්පත් දැන්වීම් පලකර තිබූ අතර මෙම දේපලවලට අදාල ටෙන්ඩර් ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වීම මත ඉහත දරන ලද වියදම සභාවේ අනාර්ථික වියදමක් වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.	2024 වර්ෂයට බදුකරු නගර සභාවට ගෙවා ඇති මුදල රු.175,721 ක් බවත් පුවත්පත් දැන්වීම් පලකිරීමට වැය කර ඇති මුදල රු.154,399 ක් බව.	ටෙන්ඩර් කැඳවීමේ දී විධිමත් අධ්‍යනයකින් හා සැලැස්මකට අනුව කටයුතු කළ යුතුය.

(i)	නගර සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ රීති අංක 395 ප්‍රකාරව දේපළ සම්බන්ධයෙන් ලංසු වටිනාකම් තීරණය කිරීම වරලත් තක්සේරුකරුවකුගේ තක්සේරු වාර්තාවක් පදනම් කර ගනිමින් කළ යුතු වුවත් රථවාහන නවතා තැබීමේ ගාස්තු අය කිරීම සඳහා වූ ටෙන්ඩර් වටිනාකම් සභාවේ නිලධාරින්ගේ තක්සේරු කමිටුවක් මඟින් සිදුකර තිබුණි.	තක්සේරු දෙපාර්තමේන්තුවෙන් මෙම තක්සේරුව ලබා ගැනීමට සැලකිය යුතු කාලයක් ගත වියහැකි බැවින් නගර සභාවේ ආදායම් පරීක්ෂක ලවා තක්සේරු වටිනාකම් ලබා ගන්නා ලද බව.	නගර සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ii)	සභාව විසින් ඉහත මාර්ග 5 හි රථවාහන නැවතුම් ගාස්තු අය කිරීම වෙනුවෙන් ටෙන්ඩර් කිරීමට තීරණය කර තිබුණද ඒ සඳහා ගාස්තු අය කිරීමේ හැකියාව පවතීද යන්න පිළිබඳව ශක්‍යතා අධ්‍යනයක් සිදුකර නොතිබීමෙන් එම ව්‍යාපෘතිය අසාර්ථක වී තිබුණි.	ඉදිරියේ දී ශක්‍යතා අධ්‍යනයක් සිදුකොට නැවත මෙම අතුරු මාර්ග බදු දීමට අපේක්ෂා කරන බව.	විධිමත් අධ්‍යනයකින් හා සැලැස්මකට අනුව කටයුතු කළ යුතුය.
(iii)	වැඩිම මිල ඉදිරිපත් කළ ටෙන්ඩර්කරු වෙත ටෙන්ඩරය පිරිනමා තිබූ අතර වාහන නැවතුම් ස්ථාන පහක් සඳහා බදු ලබාගත් අය විසින් 2024 පෙබරවාරි 15 දින සිට ටෙන්ඩරය ක්‍රියාත්මක කරමින් අදාල මාර්ගවලින් රථවාහන නැවතීම වෙනුවෙන් ගාස්තු අයකරමින් පැවතියද සභාව සමඟ ලිඛිත ගිවිසුමකට එළඹ නොතිබුණි.	රථ වාහන නැවතුම් ස්ථාන බදු දීමේ ටෙන්ඩරය 2024 ජූලි 01 දිනට අවලංගු කිරීමට කටයුතු කළ බව.	විධිමත් අධ්‍යනයකින් හා සැලැස්මකට අනුව කටයුතු කළ යුතුය.

3.3 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**ඌන උපයෝජිත වත්කම්**		
I.	පරාක්‍රම මාවත පිහිටි ගොඩනැගිල්ලෙහි වූ කියවීම් ශාලාව තුල විවිධ වැඩසටහන් පවත්වා තිබූ බව විගණනයට අනාවරණය වූ අතර, එලෙස පැවැත් වූ වැඩසටහන් පිළිබඳ විස්තර, ලිපිගොනු හෝ සභාවෙන් ලද අනුමැතීන් පිළිබඳ විස්තර පවත්වා නොතිබුණි.	ඉදිරියේ දී ඒ සම්බන්ධයෙන් ලිපිගොනුවක් නඩත්තු කිරීමට කටයුතු කරන බව.	ලිපිගෙනු හා ලේඛන විධිමත්ව පවත්වාගත යුතුය.

II.	මෙම ඉඩමට අදාලව සභාව සතුව ඔප්පු නොතිබුණු අතර, අනු රේඛනයක් පමණක් සභාව සතුව තිබුණි. ඉඩමෙහි සභාවට අයිති කොටස හඳුනාගැනිම සඳහා මායිම් වෙන්කර නොතිබුණි.	ඉඩමේ සභාවට අයිති කොටසට මායිම් හඳුනා ගැනීම සඳහා ඔප්පු සකස් කොට අනුරේඛන අනුව මායිම් වෙන් කිරීමට පියවර ගන්නා බව.	සභාව සතු දේපල හඳුනා ගෙන අයිතිය තහවුරු කරගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	සභාව සතු වර්ග අඩි 328.61 වූ මීගහවත්ත කියවීම් ශාලාව හා වර්ග අඩි 373.37 ක් වූ දරමඩුව වත්ත කියවීම් ශාලාව ඌන උපයෝජිතව පැවතුණි. මීගහවත්ත කියවීම් ශාලාව වූ ඉඩමෙහි මායිම් සොයා ගත නොහැකි වූ අතර, විගණනය විසින් සිදුකළ භෞතික පරීක්ෂාවේදී වසා දමා තිබූ ගොඩනැගිල්ලෙහි සතුන්ද නවාතැන් ගෙන සිටින බව නිරීක්ෂණය විය.	නව සභාව පත්වූ පසු මෙවැනි ස්ථාන ඵලදායී ලෙස පවත්වාගෙන යෑමට කටයුතු කරන බව.	දේපල ඵලදායී ලෙස යොදවා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	වාර්ෂික **භාණ්ඩ සමීක්ෂණය**		
	නගරසභා බල ප්‍රදේශයේ සභාව භාවිතා කරන ඉඩම් 90 ක් පැවති අතර එම ඉඩම්වලින් ඉඩම් 74 ක් සඳහා ඔප්පු ද ඉඩම් 28 ක් සඳහා පිඹුරුපත් ද නොමැති බව නිරීක්ෂණය විය.	ඉඩම් සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර ඇති බවත් නගර සභාව සතු දේපල කිහිපයක ඔප්පු සකස් කර ගැනීමට කැළණිය ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කර ඇති බව.	සභාව සතු දේපල හඳුනා ගෙන අයිතිය තහවුරු කරගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	සමීක්ෂණ වාර්තාව අනුව 2018 ජනවාරි 01 දින සිට පැරණි සාමාජිකයින් විසින් රු. 8,315 ක් වටිනා පොත් 25 රැගෙන ගොස් තිබූ අතර වසර ගණනාවක් ගත වී තිබුණද එම පොත් ආපසු පුස්තකාලයට ලබාගෙන නොතිබුණි.	සිහි කැඳවීම් 03 ක් මේ වන විට පාඨකයා සහ ඇපකරුවන් වෙත යවා ඇති බව.	පාඨකයාගෙන් හෝ ඇපකරුවන්ගෙන් අලාභය අයකර ගත යුතුය.
(ඉ)	අකුරුපිටිය කියවීම් ශාලාවේ 2024 පුස්තකාල පොත් සමීක්ෂණ වාර්තාව අනුව රු. 20,054 ක් වටිනා පොත් 53 ක්ද වටිනාකම සඳහන්ව නොමැති පොත් 03 ක්ද අස්ථානගතව පැවති බව නිරීක්ෂණය වූ අතර එම පොත්වල පාඩු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103 හා 104 පරිදි කටයුතු කර නොතිබුණි.	පොත් 14 ක් සම්බන්ධව පුස්තකාල උපදේශන කමිටුව වෙත යොමුකර ඒ අනුව ඉදිරියේදී කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඊ)	මුරුගන්වත්ත කියවීම් ශාලාවේ 2024 පුස්තකාල පොත් සමීක්ෂණ වාර්තාවට අනුව රු. 1,855 ක් වටිනා පොත් 09 ක් අස්ථානගතව පැවති බව නිරීක්ෂණය විය.	පොත් 07 ක් සම්බන්ධව පුස්තකාල උපදේශන කමිටුව වෙත යොමුකර ඒ අනුව ඉදිරියේදී කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.

(උ) **පවරා නොගත් වත්කම්**

2013 ජනවාරි 19 දින පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබූ ටොයෝටා හයිලුක්ස් වර්ගයේ රු. 3,178,227 ක් වටිනා කැබ් රථය සභාවේ නමට පවරාගෙන නොතිබුණි.	පළාත් පාලන කොමසාරිස් (බ.ප.) වෙත ද මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් වෙත ද දන්වා යවා තිබුනද මේ වන තෙක් එම ලියාපදිංචි සහතිකය අප වෙත ලැබී නොමැති බව	වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය.

3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ දුර්වලතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාව විසින් අදියර 3 කින් සිදුකර තිබූ නගර සභා පරිශ්‍රය පිටුපස වාහන අංගනයක් සැකසීමේ ව්‍යාපෘතිය සඳහා ලිපිගොනු 3ක් පවත්වාගෙන ගොස් තිබුණද, ඉදිකිරීම සඳහා වූ කමිටු තීරණ, ප්‍රසම්පාදන ක්‍රමය, තෝරාගත් ආකාරය, ඒ සඳහා ගනු ලැබූ තීරණ පිටපත් අදාල ලිපිගොනු තුලින් අනාවරණය කර ගැනීමට නොහැකි විය. මේ සම්බන්ධව පහත නිරීක්ෂණ සිදුකරනු ලැබේ.	අදාළ ව්‍යාපෘතිය සම්බන්ධ තීරණ පිටපත් ගොනු වලට ඇතුළත් කළ බව.	ගොනු යාවත්කාලීන කළ යුතුය.
I.	2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 ප්‍රකාරව උක්ත ව්‍යාපෘතියට අදාලව ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි පියවර දක්වමින් ප්‍රසම්පාදන කාල සටහන් සකස් කර නොතිබුණි.	ප්‍රසම්පාදන කාල සටහනක් සකස් කර නැති බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රපය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
II.	කාන්තා ගොවි සංවිධානය විසින් මෙම ව්‍යාපෘතියෙහි පළමු අදියරෙහි වැඩ අවසන් කර ඇති බවට ලබා දී තිබූ දින රහිත ලිපිය 2024 ජනවාරි 26 දින ලැබී තිබුණි. ගිවිසුම්පත්‍රයේ සඳහන් වැඩ විස්තර සහ සැලසුම්, නියමයන්ට අනුකූලව කර්මාන්තය නිසියාකාරව ඉටුකළ බවට වැඩ අධිකාරි/ කාර්මික නිලධාරි සහ සභාවේ ලේකම්ගේ සහතිකයකින් තොරව, බිල්පත් පරීක්ෂා කිරීම සහ ගෙවීම් කමිටු නිර්දේශයකින් තොරව 2024 ජනවාරි 26 දින රු.1,794,698 ක් එම ප්‍රජා සංවිධානය වෙත ගෙවා තිබුණි.	ඉදිරියේ දී එවැනි අතපසුවීම් සිදු නොවීමට වග බලා ගන්නා බව.	පවත්නා අභ්‍යන්තර පාලන පද්ධතියට අනුකූලව කටයුතු සිදු කළ යුතුය.

III.	සභාව විසින් පළමු අදියරේදී ඉටුකළ යුතු වැඩ ලෙස ඇස්තමේන්තු කරන ලද වැඩවලින් අයිතම දෙකට අදාලව වැඩ සැලසුම් කළ ආකාරයට ඉටු නොකර විකල්ප ක්‍රියාමාර්ගයකින් ඉටු කිරීමෙන් ඇස්තමේන්තු වටිනාකමට වඩා රු.174,578 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.	ඇස්තමේන්තුව සැකසීමේ දී යොදා ගැනීමට අපේක්ෂිත අයිතම වෙනුවට වෙනත් අයිතම යොදා ගන්නා ලද බව.	විචලනය අවම වන පරිදි ඇස්තමේන්තු සකස් කළ යුතුය.
IV	පළමු අදියර යටතේ රු.555,055 ක් වූ අමතර වැඩ සිදුකර තිබූ අතර, එම කාර්යය ඉටුකිරීමට පෙර ස්ථානීය පරීක්ෂා කිරීම් හා පරිසර විශ්ලේෂණයන් සිදු කිරීමෙන් කල්තියා හඳුනාගත හැකිව තිබූ කාර්යයක් බැවින් එම වැඩ ඇස්තමේන්තු නොකිරීම කොන්ත්‍රාත් පරිපාලනයේ දුර්වලතාවයක් වශයෙන් නිරීක්ෂණය විය.	ඉදිරියේ දී හැකිතරම් අඩුපාඩු නිවැරදි කර ගැනීමට උත්සාහ කරන බව.	විචලනය අවම වන පරිදි ඇස්තමේන්තු සකස් කළ යුතුය
V	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.3 ප්‍රකාරව කොන්ත්‍රාත් විචලනය ඇස්තමේන්තු ප්‍රතිපාදන මුදලින් සියයට 10 නොඉක්ම විය යුතු වුවද, ඉහත පළමු අදියරේ අමතර වැඩ සඳහා ගෙවීම සියයට 29 ක් විය.	ඇස්තමේන්තුව මුදල ඉක්මවා නොයන පරිදි ඉටු කළ ඇති බව.	විචලනය අවම වන පරිදි සැලසුම් සකස් කළ යුතුය
VI	දෙවන අදියර සඳහා ගෙවීම් කිරීමේදී ඇස්තමේන්තු කරන ලද එකතු වටිනාකම රු.195,192 ක කාර්යයන් දෙකක් ඉටුකර නොතිබුණු අතර අමතර හා අතිරේක වැඩ ලෙස එකතු වටිනාකම රු.597,857 ක කාර්යයන් තුනක් ඉටුකර තිබුණි.	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී පවතින මනින ලද මිනුම් අනුව ගෙවීම් සිදු කර ඇති බව.	ඇස්තමේන්තු සකස් කිරීම තාත්විකව කළ යුතුය.
VII	ව්‍යාපෘතියක් සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේදී තාත්විකව සිදු කිරීමට කටයුතු නොකිරීම නිසා ඇස්තමේන්තුවට බාහිරව කාර්යයන් ඉටු කිරීමට සිදුවීමෙන් රු.402,655ක වටිනාකමක් සභාවට ගෙවීමට සිදුවී තිබුණි.	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී පවතින මනින ලද මිනුම් අනුව ගෙවීම් සිදු කර ඇති බව.	ඇස්තමේන්තු සකස් කිරීම තාත්විකව කළ යුතුය.
(ආ)	පූජ්‍ය මේධානන්ද හිමි පෙරපාසල් ගොඩනැගිල්ලට කොටසක් එකතු කිරීම නම් වූ ව්‍යාපෘතිය සඳහා පළාත් පාලන සේවා යටතේ 2023 පෙබරවාරි 06 දිනැති පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති , පරිසර කටයුතු ජලසම්පාදන හා ජලප්‍රවාහන සහ සංචාරක කටයුතු අමාත්‍යාංශය (බස්නාහිර පළාත) යටතේ රු.5,000,000 ක් වෙන් කර තිබූ අතර ගොඩනැගිල්ලේ ඉදිකිරීම් 2023 අගෝස්තු 15 දිනට නිමකළ යුතුව තිබියදී 2023 පෙබරවාරි 6 දින අනුමත වූ ව්‍යාපෘතියෙහි		

	ඉදිකිරීම් සඳහා ගිවිසුම් අත්සන් කිරීම 2023 ජුලි 31 දින එනම් අනුමත වූ දින සිට මාස 5 ක් ප්‍රමාද වී සිදුකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.		
I	උක්ත ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති වැඩ අයිතමවලින් අයිතම 13 ක් එනම් රු.813,122 ක් ඉටු නොකර තිබූ අතර ඉටු කළ වැඩ අයිතමවලින් අයිතම 21 ක් එනම් රු.373,886 ක ඇස්තමේන්තු වැඩ ප්‍රමාණයට වඩා අඩුවෙන් ඉටුකර තිබුණි. ඒ අනුව ඉටු නොකළ වැඩ වටිනාකම රු.1,187,008 ක් එනම් ඇස්තමේන්තු වටිනාකමින් සියයට 26 ක් විය.	සමහර අයිතම ඇස්තමේන්තුවේ යොදා තිබුනත් එම ව්‍යාපෘතිය කරන අවස්ථාවේ දී හේතු කාරණා මත මෙම අයිතමයන් ඉටු නොකිරීමට තීරණය වූ අතර එම අයිතමයන් වෙනුවෙන් එයට සමාන වන ක්‍රියාවන් එම අවස්ථාවේදිම සිදු කිරීමට සිදුවූ බව.	ඇස්තමේන්තු සකස් කිරීම තාත්විකව සිදු කළ යුතුය.
II	සභාව විසින් නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල නොකිරිම හේතුවෙන් ඇස්තමේන්තු කළ වැඩ ප්‍රමාණයට වඩා වැඩ අයිතම 24 ක ප්‍රමාණ වැඩිවීම හේතුවෙන් ඇස්තමේන්තු වටිනාකමට වඩා රු.535,965 ක් වැඩිපුර ගෙවා තිබුණි.	ඇස්තමේන්තුවට අදාලව සිදු කිරිමට නොහැකි කාර්යයන් වෙනස් කිරීමේ දී මිල ගණන් අඩු වූ අයිතමයන්වල එකතුවෙන් මෙම ව්‍යාපෘතියට අදාලව සිදු කළ යුතු අමතර කාර්යයන් ඉටු කළ බව.	ඇස්තමේන්තු සකස් කිරීම තාත්විකව සිදු කළ යුතුය.
(ඇ)	2021 වර්ෂයේදි සභාව විසින් පාලරයක් ලෙස භාවිතා කිරීම සඳහා මහල් 04කින් යුත් ගොඩනැගිල්ලක් පැලියගොඩ පරණ නුවර පාර අංක 50 දරන ස්ථානයේ ඉදිකිරීමට තීරණය කර තිබූ අතර, ඒ අනුව ඇස්තමේන්තු සකස් කර උපදේශන සේවා ආයතනයක් තෝරාගෙන ඇස්තමේන්තු සකස් කර මූලික කාර්යයන් ආරම්භ කර රු.28,026,307 ක් ගෙවීම් කර තිබුණි. එසේ වුවද 2022 වර්ෂයේදි එම ව්‍යාපෘතිය නවතා දැමීම හේතුවෙන් සභාව වෙත කොන්ත්‍රාත් සමාගමෙන් රු.19,940,985 ක් පමණක් ආපසු අයකර ගැනීමට හැකිව තිබීමෙන් රු. 8,085,322 ක මුදලක් සභාවට අහිමි වී තිබුණි.	පාලරය ඉදි කිරීම සඳහා ශක්‍යතා අධ්‍යනයක් සිදු කර නොමැති බව.	ශක්‍යතා අධ්‍යනයක් සිදු කළ යුතුය. එසේ නොමැතිව ව්‍යාපෘති අනුමත කළ නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඇ)	ප්‍රජා සංවිධානය විසින් සංවිධානයට ලැබෙන කොන්ත්‍රාත් සමිතිය වෙත සම්බන්ධතාවයක් නොමැති බාහිර පාර්ශවන් වෙත ලබා දෙනු ලබන බවත් සමිති 05 කට අදාලව ලැබෙන කොන්ත්‍රාත් එකම බාහිර කොන්ත්‍රාත් කරුවෙකු වෙතම ලබාදෙන බවත් විගණනයට අනාවරණය විය. ඒ අනුව සභාවේ ව්‍යාපාති නියමිත කාල සීමාවට නිම කිරීමට	නගර සභාව ගිවිසුම් ගත විම ප්‍රජා පාදක සංවිධානය සමග පමණක් බවත් උප කොන්ත්‍රාත් නොදන බවට ද සඳහන් කර ලිපි ඉදිරිපත් කර ඇති බව.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

	නොහැකිවීමෙන් කාලය දීර්ඝ කිරීම් සිදුවී තිබූ බව නිරීක්ෂණය විය.		
(ඉ)	භාණ්ඩාගාර ලේකම්ගේ 2021 සැප්තැම්බර් 29 දිනැති අංක PED/PMD/Cir/2021/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2.2 ඡේදය ප්‍රකාරව ප්‍රජා පාදක සමිතියකට පිරිනැමිය හැකි කොන්ත්‍රාත් වටිනාකමේ එකතුව රු. මිලියන 05 ක් බව දක්වා තිබුණද සභාව විසින් රු. මිලියන 05 ඉක්මවා කාන්තා ගොවි සංවිධානයකට අවස්ථා 06 කදී සහ ජ්‍යෙෂ්ඨ පුරවැසි සමිතියකට අවස්ථා 03 කදී ද ඍජු පදනම මත කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි.	එකවර ව්‍යාපෘති 03 ක ට වැඩියෙන් ගිවිසුම් ගතව වැඩ කර නොමැති බව.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

3.5 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට අනුමත තනතුරු 18 ක පුරප්පාඩු 31ක් විය. වසර ගණනාවක සිට පැවත එන මෙම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි.	චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රාථමික තනතුරු සඳහා බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටුවා ඇති බව.	පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය.
(ආ)	2001 අගෝස්තු 22 දිනැති හා අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි වර්ෂ 05 කට වරක් කාර්යමණ්ඩලය ස්ථාන මාරු සිදුකළ යුතු වුවත් කළමනාකරණ සේවා නිලධාරීන් 09 දෙනෙකු වසර 06 සිට වසර 11 දක්වාද, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් වසර 06 ක සිටද, ආදායම් පරීක්ෂක නිලධාරීවරයා වසර 09 ක සිටද ස්ථාන මාරු නොලබා සභාවේ සේවය කර තිබුණි.	ස්ථාන මාරු ලැබූ නිලධාරීන් දෙදෙනාගෙන් එක් අයෙකුගේ අනුප්‍රාප්තික නිලධාරියා නොපැමිනීම මත සහ සේවයේ අවශ්‍යතාවය මත දැනට සභාවේ සේවයේ යෙදී සිටින බව.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඇ)	2024 වර්ෂය සඳහා මානව සම්පත් පුහුණු වැඩසටහන් 13 ක් සැලසුම් කර තිබූ අතර එයින් වැඩසටහන් හතරක් වර්ෂය තුල ක්‍රියාත්මක කර නොතිබුණි. පුහුණුව සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදන වටිනාකම රු. 1,105,200 ක් වූ අතර වැයකර තිබූ වටිනාකම රු. 646,774 ක් වී තිබුණි.	සංවර්ධන ව්‍යාපෘති හා ඉදිකිරීම් කටයුතු පිළිබඳ පුහුණුව සහ පුරවැසි ප්‍රඥප්ති පිළිබඳ පුහුණුව ඉදිරියේ දී පවත්වන බව.	සැලසුම් කරන ලද පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු කළ යුතුය.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
එකතුව රු.54,070,000 ක් වූ අවස්ථා 20 ක දී වෙන් කරන ලද ප්‍රතිපාදන හා වෙනත් වැය ශීර්ෂයන් වෙත මාරුකර තිබූ ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. ඒ අනුව අයවැය මූලාා පාලන කාරකයක් ලෙස යොදා නොගන්නා බව නිරීක්ෂණය විය.	ඉදිරි ගිණුම් වර්ෂයන්හි මෙම කරුණු සැලකිල්ලට ගනිමින් තාත්වික අයවැය ලේඛනයක් සකස් කිරීමට කටයුතු කරන බව.	අයවැය මූලාා පාලන කාරකයක් ලෙස යොදා ගත යුතුය.